# දැන්වීමයි
# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**2022 වසර සඳහා ගොඩනැගිලි සහ මාර්ග අලුත්වැඩියාව, වැඩි දියුණු කිරීම හා ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.**

1. 2022 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි හා මාර්ග අලුත්වැඩියාවන්, වැඩි දියුණු කිරීම හා ඉදිකිරීම සඳහා ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. මේ සඳහා කැමැත්තක් දක්වන ඉල්ලුම්කරුවන්, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) මගින් සංවර්ධන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ හා ශ්‍රේණිගත කිරීමේ ජාතික යෝජනා ක්‍රමය යටතේ, ගොඩනැගිලි ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති ශ්‍රේණිය, ලියාපදිංචි අංකය, ලියාපදිංචි වටිනාකම සඳහන් කලයුතු අතර ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රාජ්‍ය සංස්ථා, රජයේ දෙපාර්තමේන්තු යනාදියෙන් ලබාගත් ඒ හා සමානව ලියාපදිංචියට අදාල විස්තරද සඳහන් කල යුතුය.

3. ආපසු නොගෙවනු ලබන රුපියල් දහසක (රු 1,000.00) අයදුම්පත් ගාස්තුවක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සරප් වෙත මුදලින් ගෙවා, 2021.10.13 දින සිට 2021.11.12 දින දක්වා වැඩ කරන දිනයන්හි පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා සරප් අංශයෙන් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ලබාගත හැකිය. කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් විශ්වවිද්‍යාලය නිල වෙබ් අඩවියෙන් (www.pdn.ac.lk) ද බාගත හැකිය. එසේ වෙබ් අඩවියෙන් බාගත කරන්නේ නම්, 'මුල්‍යාධිකාරී, පේරාදෙණිය විශ්වවිද්‍යාලය' වෙත ආපසු නොගෙවනු ලබන රුපියල් දහසක (රු 1,000.00) වටිනාකමින් යුත් බැංකු අණකරයක් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.

4. අදාල ඉල්ලුම්පත් පිටපත් දෙකකින් යුතුව ලියුම් කවරයක බහා එහි වම්පස උඩ කෙලවරේ **"2022 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම"** ලෙස සටහන් කර **ලේඛකාධිකාරී, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය** වෙත ලියාපදිංචි තැපෑලෙන් **2021/11/12** වැනි දින හෝ ඊට ප්‍රථම එවිය යුතුයි. අතින් ගෙන එනු ලබන ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

5. ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා, අදාළ සේවා ඉටුකරගැනීම සාමාන්‍ය ක්‍රියා පිළිවෙත වුවත්, අවශ්‍ය වූ විටක ඉන් පරිබාහිරවද මිල ගණන් කැඳවා සේවා ඉටුකර ගැනීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය. කිසිදු හේතුවක් නොදන්වා ඉල්ලුම්පත් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

6. ඉහත දිනයට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

වැඩබලන ලේඛකාධිකාරී
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

